www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාවේ අලුත් ආන්ඩුව වොෂිංටනයට පක්ෂපාතිත්වය ප්‍රදර්ශනය කරයි

**New Indian government demonstrates loyalty to Washington**

**විලානි පීරිස් විසිනි**
**2004 ඔක්තෝබර් 22**

භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) නායකත්වයෙන් යුත් පැවති ආන්ඩුව වොෂිංටනය සමග තහවුරු කර ගත් සබඳතා පවත්වා ගෙන යාමට පමනක් නොව ඒවා ශක්තිමත් කිරීමටත් කොංග්‍රස් නායකත්වයෙන් යුත් අලුත් ආන්ඩුව පියවර ගන්නා බව ඉන්දියානු අගමැති මන්මෝහන් සිං පසුගිය මාසයේ දී එක්සත් ජනපදයට කල සංචාරය මගින් පැහැදිලි කෙරී තිබේ.

සිංගේ ගමන මැයි මස පැවති ඉන්දියානු මැතිවරනයෙන් කොංග්‍රසය නො සිතූ ජයක් අත් කර ගැනීමෙන් පසුව සිදු කල ඔහුගේ ප්‍රථම විදේශ සංචාරය යි. එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලයට සහභාගි වනු පිනිස නිව් යෝර්ක් නුවර කරා යාමට පලමුව ඔහු ලන්ඩනයේ දී බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් හමු විය. කෙසේ වෙතත්, වඩා අර්ථභාරී වූයේ එක්සත් ජනපදය සමග ඉන්දියාවේ සමීප මූලෝපායික හා ආර්ථික සබඳතා පිලිබඳව ජනාධිපති ජෝර්ජ් බුෂ් සහ සෙසු ඉහල පෙලේ ඇමරිකානු නිලධාරින් සමග ඔහු පැවැත්වූ සාකච්ඡා ය.

ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ-මාක්ස්වාදී (සීපීඅයි-එම්) සහ සෙසු "වාම" පක්ෂවල පිටුබලය සහිතව කොංග්‍රසය සහාග ආන්ඩුවක් තැනූ කල පාලක කවයන් තුල මතු වූ එක් උත්සුකතාවක් වූයේ වොෂිංටනය සමග ඉන්දියාවේ සබඳතා අවිනිශ්චිත තත්වයකට පත් විය හැකි බව යි. මැතිවරන උද්ඝෝෂනය තුල දී කොංග්‍රස් නායකයන් බීජේපීයේ එක්සත් ජනපද ගැති දිශාවනතිය විවේචනය කොට තිබුනි. කෙසේ වෙතත්, ඒ පිලිබඳ සියලු සැක සංකා දුරු කරනු පිනිස පසුගිය මාසයේ දී සිං මහත් වෙහෙසක් ගත්තේ ය. විදේශ සබඳතා මන්ඩලයට කල කතාවක දී ඔහු මෙසේ අවධාරනය කලේ ය: "අප (එක්සත් ජනපදය සහ ඉන්දියාව) සිටින්නේ එක ම පැත්තේ ය."

එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය ඉදිරියේ කල සිය කතාවේ දී, සිං, බුෂ් ආන්ඩුවේ "ත්‍රස්ත විරෝධී භූගෝලීය යුද්ධයට" තම ආන්ඩුවේ සහයෝගය ප්‍රකාශ කරමින් සහ එක්සත් ජනපදය ඉරාකයේ පවත්වා ගෙන යන නීති විරෝධී වාඩිලෑම ගැන නිහඬව සිටිමින් ඉහත කාරනාව තහවුරු කලේ ය. "(ඉරාක) ජනතාවගේ වධ වේදනා අවසන් වීම" පිලිබඳ හිස් බලාපොරොත්තු ප්‍රකාශයට පත් කල ඔහු ඇෆ්ඝනිස්තානයට "අවුල් වියවුල්වලින් ගැලවී ගැනීමට" උදව් කිරීම සම්බන්ධයෙන් "ජාත්‍යන්තර ප්‍රජාවට" ප්‍රශංසා කලේ ය.

සිංගේ ආගමනයට යන්තම් පෙරාතුව, එරට න්‍යෂ්ටික බලාගාර සහ සිවිල් අභ්‍යවකාශ වැඩ සටහන් සඳහා අවශ්‍ය තාක්ෂනය ඇතුලු සංවේදී එක්සත් ජනපද තාක්ෂනය ඉන්දියාවට අලෙවි කිරීම සම්බන්ධයෙන් පැවති සීමාවන් ඉවත් කිරීමට බුෂ් පරිපාලනය පියවර ගත්තේ ය. ඉන්දියාව හා පකිස්තානය න්‍යෂ්ටික ආයුධ අත්හදා බැලීමෙන් පසුව 1998 දී එම දෙරට මත ම මෙම තහංචි පනවන ලදි. තහංචි ඉවත් කිරීමට එකඟ වීම සිදු වූයේ "මූලෝපායික හවුල්කාරිත්වයේ ඊලඟ පියවර" නම් වූ වැඩපිලිවෙලේ කොටසක් ලෙස ජනවාරියේ දී නමුදු එම එකඟතාව ක්‍රියාවට දැමීමට මේ අවස්ථාව තෝරා ගැනීම ඉන්දියාවේ අලුත් ආන්ඩුව සමග හොඳ සබඳතා වගා දිගා කර ගනු පිනිස පැහැදිලිව ම සැලසුම් කල එකකි.

කලින් පැවති ක්ලින්ටන් ආන්ඩුව යටතේ ඉන්දියාව සමග වර්ධනය කෙරුනු සබඳතා පුලුල් කිරීමෙහි ලා බුෂ් පරිපාලනය අතිශය උනන්දු සහගත වී ඇත. ඉන්දියාව ප්‍රධාන ලාභ ශ්‍රම උල්පතක් ලෙස මතුව ඇතිවා පමනක් නොව යාබද මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ සිය ආධිපත්‍යය සහතික කර ගැනීමේ එක්සත් ජනපද සැලසුම්වල ප්‍රධාන අංගයක් ලෙස ද එරට දැකගනු ලැබේ. ඉන්දියාව ආසියාව තුල චීනයේ වැඩෙන ආනුභාවයට එරෙහි තීරනාත්මක ප්‍රතිභාරයක් ලෙස ද එක්සත් ජනපදය සලකයි.

සැප්තැම්බර් 21 දා සිං බුෂ් සහ රාජ්‍ය ලේකම් කොලින් පවෙල්, ජාතික ආරක්ෂක උපදේශක කොන්ඩලීසා රයිස් හා හිටපු එක්සත් ජනපද තානාපති රොබට් බ්ලැක්විල් ඇතුලු සෙසු ඉහල පෙලේ නිලධාරින් හමු විය. එම හමුවෙන් පසුව නිකුත් කල ඒකාබද්ධ නිවේදනය සඳහන් කල පරිදි, "ද්වි-පාර්ශ්වික සබඳතා මේ දැන් පවත්නා තරම් සමීප මට්ටමක කිසි දාක නො තිබුනු අතර ඔවුන් (බුෂ් හා සිං) ඉන්දියානු-එක්සත් ජනපද මූලෝපායික හවුලේ තව දුර වර්ධනය සඳහා දිශාවනතිය සැකසී ය. . . . පුලුල් කෙරුනු

ආරක්ෂක සහයෝගිතාව සබඳතා පුලුල් කිරීම හා බැඳුනු අංගයක් ලෙස අවබෝධ කර ගැනුනි."

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග සහයෝගිතාව වැලඳ ගැනීමෙහි ලා සිං ඔහුගේ බීජේපී පූර්වගාමියා වන අතාල් බෙහාරි වජ්පායිට නොඅඩු නිවට භාවයක් පෙන්නුම් කර ඇත. තමන්ට "පවත්නා තත්වය සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි" යයි තමා හා බුෂ් එකඟ වී ඇතැයි ඔහු නිව් යොර්ක් නුවර දී මාධ්‍ය ඉදිරියේ පාරම් බෑවේ ය. "හොඳම තත්වය තව මත් එලඹීමට තිබේ" යන වචන මා භාවිතා කල විට ජනාධිපතිතුමා කියා සිටියේ "ඔව් මම එයට එකඟ වෙමි" කියා ය. "අප අතර පවත්නා එකඟතාවයේ මට්ටම එය යි."

බොහෝ කලාපීය ගැටලු සම්බන්ධයෙන් එක්සත් ජනපද හා ඉන්දියානු අවශ්‍යතා සම්පාත වේ. සිං ආන්ඩුව ඇෆ්ඝනිස්තානය තුල එක්සත් ජනපද මැදිහත්වීමට පිටුබලය සපයන්නේ, එය එරට තුල සිය ප්‍රතිවාදියා වන පකිස්තානයේ බලපෑම දුර්වල කිරීමේ විධි ක්‍රමයක් ලෙස සලකා ගෙන ය. එක්සත් ජනපදය සහ ඉන්දියාව යන දෙගොල්ල ම නේපාලයේ රාජාන්ඩුවට පිටුබලය සැපයීමෙහි ද මාඕවාදී කැරලිකරුවන්ට එරෙහිව නේපාල මිලිටරියට අවි සම්පාදනයේ ද යෙදී සිටී. ශ්‍රී ලංකාව තුල දී, මෙම දෙගොල්ල ම රටේ දිගු කාලීන සිවිල් යුද්ධය අවසන් කරනු පිනිස ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ සම්මුතියකට යන ලෙස දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට බල කිරීමෙහි යෙදී සිටිති.

පකිස්තානය සමග සුහද සබඳතා වර්ධනය කර ගන්නා ලෙස බුෂ් ආන්ඩුව ඉන්දියාවට බල කිරීමෙහි ද යෙදී සිටී. වොෂිංටනය සලකන්නේ දෙරට අතර දශක ගනනාවක් තිස්සේ පවත්නා කටුක එදිරිවාදිකම් කලාපයේ ලාභ ශ්‍රමය සූරාකෑමේ ද සිය පුලුල් අභිලාෂයන් සඳහා ප්‍රධාන පදනමක් ලෙස ඉන්දියාව යොදා ගැනීමේ ද සැලසුම්වලට වල කපන භයානක බාධාවක් ලෙස ය. මේ අවස්ථාවේ, පකිස්තානය ද ඇෆ්ඝනිස්තානයේ එක්සත් ජනපදය විසින් අටවන ලද රූකඩ තන්ත්‍රයට එරෙහි සන්නද්ධ කන්ඩායම් මැඩීමෙහි ලා එක්සත් ජනපදය වෙනුවෙන් වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කරයි.

බීජේපී නායකත්වයෙන් යුත් ආන්ඩුව යටතේ ඇරඹුනු පකිස්තානය සමග සාකච්ඡා සිං දිගට ම ඉදිරියට ගෙන ගොස් තිබේ. ඔහු එක්සත් ජාතීන්ගේ මහා මන්ඩල සැසි වාරය අතරතුර දී පකිස්තාන ජනාධිපති පර්වෙස් මුෂාරෆ් හමු වූ අතර පැවති සාකච්ඡා "වැදගත් ඉදිරි පියවරක්" ලෙස විස්තර කලේ ය. දෙරට ම ආර්ථිකමය අවස්ථා හා වෙලඳාම පුලුල් කර ගැනීමේ ආශාවෙන් පෙලෙති. ඉරානයේ සිට පකිස්තානය හරහා ඉන්දියාව දක්වා තෙල් නල මාර්ගයක් ඉදිකිරීමේ සැලසුම් සලකා බැලීමට සිං එකඟ විය. මෙය කලින් නව දිල්ලිය ප්‍රතික්ෂේප කල යෝජනාවකි.

මූලික ප්‍රශ්නය වන කාශ්මීරය සම්බන්ධයෙන් "සාමකාමී සාකච්ඡාමය විසඳුමක් සඳහා පැවතිය හැකි විකල්ප" සොයා බැලීමට සිං හා මුෂාරෆ් එකඟ විය. එහෙත් ඒ පිලිබඳ කිසිදු සංයුක්ත යෝජනාවක් ඉදිරිපත් කලේ නැත. 1947 දී උප-මහාද්වීපය වර්ගෝත්තමවාදී පදනමකින් බෙදීමෙහි ප්‍රතිඵලයක් වූ කාශ්මීරය පිලිබඳ මතභේදය මෙම දෙරට අතර දෙවරක් ම යුද්ධ අවුලුවා ඇති අතර 2002 දී තෙවන මිලිටරි ගැටුමක් ඇවිලීමේ තර්ජනය ද මතු කලේ ය. තමන්ගේ පාලන බලයන්ට පිටුබලය ලබා ගනු පිනිස දෙරටේ ම පාලක ප්‍රභූන් ගසාකන වර්ගෝත්තමවාදී දේශපාලනයෙහි කේන්ද්‍රීය කාරනාව ලෙස පැවතී ඇති කාශ්මීරය සම්බන්ධයෙන් සම්මුතිවාදී වීමේ හැකියාවක් එකදු පාර්ශ්වයකට වත් නැත.

සිය සංචාරය තුල දී සිං සංගත ප්‍රභූන් වෙත ද සෘජු ආයාචනයක් කලේ ය. ඔහු නිව් යෝර්ක් කොටස් වෙලඳ පොල අමතමින් ඊලඟ දශකය තුල ඉන්දියාවට ඩොලර් බිලියන 150ක ආයෝජන ලබා දෙන මෙන් ඉල්ලා සිටියේ ය. මෙය වනාහි ඉතිහාසයේ ප්‍රථම වතාවට ඉන්දියානු අගමැතිවරයකු නිව් යෝර්ක් කොටස් වෙලඳ පොලෙහි රැස්වීමකට සහභාගි වූ අවස්ථාව විය. එවකට මුදල් ඇමති ලෙස 1990 ගනන් මුල දී වෙලඳ පොල ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ආරම්භ කල සිං සිය ආන්ඩුව "ආර්ථික ප්‍රතිසංස්කරන ක්‍රියාදාමය ගැඹුරු හා පුලුල් කරන" බවට බුෂ් සමග පැවති සාකච්ඡාවල දී පොරොන්දු විය.

"පුද්ගලීකරන පිලිවෙතෙහි කිසිදු ආපසු හැරීමක් සිදු නොවනු ඇතැ" යි *වෝල් ස්ට්‍රීට් ජර්නල්* සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී සිං අවධාරනය කලේ ය. විදේශ ආයෝජන දිරිගන්වමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේ යඃ "ඉන්දියාව දැන් විවෘත වූ පොතකි." නිව් යෝර්ක් නුවර පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී සිං භූගෝලීය ප්‍රාග්ධනය වෙත ඉදිරිපත් කරන සිය පනිවිඩය මෙසේ නිර්භයව සාරාංශ ගත කලේ යඃ "මා මෙහි පැමින සිටින්නේ ඉන්දියාව විකිනීම පිනිස ය. අගමැති ලෙස මගේ යුතුකම වන්නේ ඉන්දියාවේ වටිනාකම ප්‍රචාරනය කිරීම ය."

සිංගේ මෙම අදහස් දැක්වීම් කරන ලද්දේ, අගමැති නිව් යෝර්ක් නුවර දී අලෙවිකරුවකු ලෙස හැසිරෙන බව ප්‍රකාශ කරමින් සීපීඅයි-එම් නායක හා බටහිර බෙංගාලයේ හිටපු මහ ඇමති ජෝති බාසු විසින් කරන ලද බෙලහීන විවේචනයට ප්‍රතිචාරයක් වශයෙනි. කෙසේ වෙතත්, සීපීඅයි-එම් සංවිධානයට සුලුතර ආන්ඩුවට දෙන සිය සහයෝගය ඉවත් කර ගැනීමේ අභිප්‍රායක් නම් — අඩු ගනනේ මේ අවස්ථාවේ දී වත් — නැත. බීජේපීයට එරෙහි "අඩු නපුර" ලෙස කොංග්‍රසයට මුක්කු ගසා ඇති සීපීඅයි-එම් නව ආන්ඩුවේ පිලිවෙත්වලට එරෙහිව වැඩෙන වෛරය අපසරනය කිරීමෙහි ලා උත්සුකව සිටී.

1947 සිට 1990 ගනන් මැද දක්වා ම එක දිගට ම පාහේ බලයේ සිටි ඉන්දියානු ධනේශ්වරයේ සම්ප්‍රදායික

පක්ෂය වන කොංග්‍රස් පක්ෂයේ විදේශ පිලිවෙතෙහි තියුනු වෙනසක් සිංගේ සංචාරය මගින් නියෝජනය කෙරේ. ශීතල යුද්ධ කාල පරිච්ඡේදය තුල දී ඉන්දියාව ඊනියා නොබැඳි ව්‍යාපාරයේ නායක රටවලින් එකක් විය. එකල වොෂිංටනය හා මොස්කෝව අතර තුලනය වීමේ හැකියාව කොංග්‍රස් ආන්ඩුවට ලැබුනි. සෝවියට් සංගමයෙන් සැලකිය යුතු ආධාර ලබා ගත්තාට අමතරව, මොස්කෝවේ ආශිර්වාදය සහිතව "අධිරාජ්‍ය විරෝධී" පූච්චානම් ප්‍රකාශ කිරීමෙහි හැකියාව ද කොංග්‍රස් දේශපාලනඥයන්ට ලැබුනි.

එහෙත් සෝවියට් සංගමය බිඳ වැටීමත් සමග උපාමාරු දැමීම සඳහා පැවති රාජ්‍යතාන්ත්‍රික ඉඩකඩ ද අහෝසි වී ගොස් ඇත. හින්දු අධිපතිවාදී බීජේපීය කලාපය තුල ඉන්දියාවේ අභිලාෂයන් හඹා යාමේ විධි ක්‍රමයක් ලෙස 1990 ගනන් අග දි වොෂිංටනය සමග මූලෝපායික සන්ධානයක් තනා ගැනීමේ ක්‍රියාදාමය ආරම්භ කලේ ය. එහෙත් ඉන්දියානු ධනවාදයට එක්සත් ජනපදය විරසක කර ගැනීමක් දරා ගත නොහැකි ය යන කාරනාව සිං සිය පූර්වගාමියා වන වජ්පායිටත් වඩා නොඅඩු ලෙස හඳුනා ගෙන තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස කොංග්‍රස් නායකත්වයෙන් යුත් ආන්ඩුව ඉන්දියානු ලාභ ශ්‍රමය එක්සත් ජනපද සංගතවලට විකිනීමටත් දකුනු ආසියාව තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ කීකරු ලූතිනන් ලෙස ක්‍රියා කිරීමෙන් වාසි ලබා ගැනීමටත් උත්සාහ දරන තතු යටතේ එක්සත් ජනපදය පිලිබඳ බෙලහීන විවේචන පවා ඉක්මනින් ම අතහැර දමා තිබේ.

© www.wsws.org